# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2344/20 - 2023 අගෝස්තු මස 09 වැනි බදාදා - 2023.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය* : ව/ප්‍රාලේ/1/3/4/2018/02.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/7/2018/එච්ඩබ්/07.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 250ඒ, කුරුකුලාව දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කුරුකුලාව ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවෙන් ගම්පහ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක 512022, කලාප අංක 04, පත්‍ර අංක 1 හා 2023.06.22 දිනැති කැඩැස්තර සිතියමෙහි මුළු ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0091 ක් වූ පහත දැක්වෙන ඉඩම් කොටස්:

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: මිල්ලගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සීමන්නේරු පතිරණගේ කේෂාන් සමීර, අංක 310/ඒ, කුරුකුලාව, රාගම (ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0048.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම: කෝන්ගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: නාවලගේ පැන්ට්‍රලියන් නිශාන්ත කුරේ, අංක 309/බී, කුරුකුලාව, රාගම (ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0043.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2023.09.13 වැනි


1A - G 040074 - 10 (2023/08)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

දින, පූ.භා. 10.00ට වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2023.09.13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

පී. ඩී. ටී. සී. රාජිකා,
ප්‍රාදේශීය ලේකම් හා
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
වත්තල.

2023 අගෝස්තු මස 07 වැනි දින,
වත්තල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 - 0088